GMOA

ESTABLISHED IN
1926
TU No. 291

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION

No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

26/9/2012

# මාධ්‍ය නිවේදනයයි.

**අදූරදර්ශී පරිපාලනය හේතුවෙන් කරවනැල්ල මූලික රෝහලේ රෝගී ජීවිත අවදානමේ.**

කරවනැල්ල මූලික රෝහලේ වෛද්‍ය අධිකාරීවරයා පසුගිය වසරක කාලයක් මුළුල්ලේ පෞද්ගලික හේතුවක් මත විදෙස්ගතව සිටි අතර එම කාලයේ වැඩ බලන වෛද්‍ය අධිකාරීතුමා විසින් රෝහලේ සියළුම කටයුතු ඉතා විධිමත්ව හා කාර්යක්ෂමව පවත්වාගෙන යනු ලැබීය. වෛද්‍ය අධිකාරීවරයා නැවත පැමිණීමත් සමඟ රෝහල තුල ඉතා අර්බුදකාරී තත්වයකට පත්විය.

ඔහු නැවත පැමිණීමත් සමඟ රෝහලේ සේවාවන් වල බොහෝ ගැටළු සහගත තත්වයකට පත්වී ඇති අතර රෝගී සත්කාරයට බලපාන ප්‍රායෝගික ගැටළු හඳුනා නොගැනිම, එම ගැටළු පෙන්වා දුන්නද විධිමත් ක්‍රියා මාර්ග නොගැනීම, දැනුම් දීමකින් තොරව පුහුණු වෛද්‍ය නිලධාරින් අත්තනෝමතික ලෙස වෙනත් ඒකක සඳහා අනුයුක්ත කිරිම, විශේෂඥ වෛද්‍යවරුන්ගේ උපදෙස් වලට පටහැනිව රෝගී සත්කාරයට බලපාන තීරණාත්මක තීන්දු ගැනීම මෙන්ම ඒ පිළිබඳ දැනුවත් කිරීමට ඉදිරිපත් වූ විට බැනවදිමින් කලහකාරී ලෙස හැසිරෙමින් වෛද්‍ය අධිකාරී වරයෙකුට නොගැලපෙන ලෙස ක්‍රියා කරමින් සිටී.

මෙම වෛද්‍ය අධිකාරිවරයා ඉහත අත්තනෝමතික ක්‍රියාවන් නැවත නැවතත් සිදු කරමින් පවතින බැවින්, ඔහුව මෙම රෝහලෙන් ඉවත් නොකලහොත් කරවනැල්ල මූලික රෝහලේ සියළුම වෛද්‍ය නිලධාරීන් 2012-09-27 සිට අඛණ්ඩ වැඩ වර්ජනයක් ක්‍රියාත්මක කරන බව දන්වා සිටිමු.

ස්තූතියි,

වෛද්‍ය චන්දික එපිටකඩුව
ලේකම්.

වැඩිදුර විස්තර :

| | |
|---|---|
| වෛද්‍ය නාත් විජේසූරිය | 0714928322 |
| වෛද්‍ය අමිල ගුනවර්ධන | 0772615503 |